ඕසකා විශ්වවිද්‍යාලය

**බැලැස්ටික් මිසයිලයක් ඇදවැටුනු අවස්ථාවක ගත යුතු ක්‍රියාමාර්ග.(නිවරැදි කරනු ලැබු තොරතුරු )**

**(විදේශිකයන් සඳහා)**

බැලැස්ටික් මිසයිලයක් නිකුත්කර විනාඩි10ක් අතර කෙටි කාලයක් තුල ජපානයට ලගාවනු ඇත.ජපානයට මිසයිල ලගාවීමේදි ජපානයට වැටීමට ඉඩඇතිනම් ජපානයේ විශේෂ හදිසි තොරතුරු පද්ධතිය යටතේ ජපන් රජය මගින් පවත්වනු ලබන හදිසි පූර්ව අනතුරු ඇගවීම් පද්ධතිය “J Alert” මගින් විද්‍යුත් මාර්ගයෙන් තොරතුරු සැපයීම සිදු කරනු ලබයි.

◎සටහන

මිසයිල ලගාවන ප්‍රදේශය පිළිබඳ තොරතුරු පූර්ව අනතුරු ඇගවීම් විද්‍යුත් පණිවිඩයක් මගින් ලබා ගත හැක.

https://www.youtube.com/watch?v=4gZW7HRHJmM

◎ජාතික ආරක්ෂාව පිළිබඳ සංඥාව (J-Alert) පිළිබඳ

“J-Alert” යනු එක් එක් පළාත්වල ස්ථාපනය කර ඇති සයිරෙන් ,ජංගම දුරකථන,ගුවන් විදුලි ,රූපවාහිනි ආදිය මගින් සංඥාවක් නිකුත් කරනු ලබයි.මීට අමතරව ,ජපන් භාෂාවෙන් පහත දැක්වෙන පරිදි සංඥා ලබාදීමද සිදුකරනු ලබයි.

http://www.kokuminhogo.go.jp/en/about/means.html#siren

උදා:වහාම ඉවත්වන්න…වහාම ඉවත්වන්න…ශක්තිමත් ගොඩනැගිල්ලක් ඇතුලට හෝ ගොඩනැගිල්ලක භූගත ප්‍රදේශයකට ඉවත් වන්න.මිසයිලයක් ඇදවැටීමට ඉඩ කඩ ඇත.වහාම ගෘහස්ථව ඔබේ ආරක්ෂාව සපයා ගන්න.

සමහරවිට ,ඔබ භාවිතා කරන දුරකථනයට ඔබට මෙතෙක් කල් ලැබී නොමැති ආකාරයේ හඬක් (සයිරෙන්)පිටවීමට පටන් ගතහොත් (එම සංඥාව ජපන් භාෂාවෙන් නාදවේ)එය තේරුම් ගත නොහැකිනම්,අසල සිටින ජපන් ජාතිකයෙකුගෙන් එය අසා දැනගන්න.

**<u>ඉක්මනින් ශක්තිමත් ගොඩනැගිල්ලකට</u> හෝ භූගත ස්ථානයකට යන්න.**

●ඔබ එළිමහනක රැදිසිටින අවස්ථාවකනම්,ඔබගේ මුඛය සහ නාසය ලේන්සුවකින් ආවරණය කර ගන්න.ඔබ සිටින ස්ථානයෙන් වහාම ආරක්ෂාකාරී ස්ථානයකට යන්න.

●ඔබ ගෘහස්ථව රැදිසිටින්නේනම්,ගෘහස්ථව ඇති විදුලිපංකා සියල්ල නිවාදමන්න.සියලු කවුළු ආදිය ඉක්මනින් වසාදමන්න.ඔබ රැදිසිටින ගොඩනැගිල්ලේ ඇති ආරක්ෂිතම ස්ථානයකට ගොස් වහාම ආරක්ෂාව සපයාගන්න.

ඕසකා විශ්වවිද්‍යාලය අමාත්‍යමණ්ඩල ලේකම් විසින් ජපානයේ රැදිසිටින විදේශිකයන් සඳහා සංස්කරණය කරන ලද තොරතුරු මත පදනම්ව ඕසකා විශ්වවිද්‍යාලයේ බහුභාෂා හා විවිධ ආපදා අවස්ථා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරනු ලබයි.හදිසි තොරතුරු ලබා ගැනිම සඳහා (ඕසකා විශ්වවිද්‍යාලයේ බහුභාෂා තොරතුරු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.)

◎http://www.respect.osaka-u.ac.jp/activities/notice/general_disaster_info_multilingual/